සියලු ම හිමිකම් ඇවිරිණි)
All Rights Reserved)

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2016

## Primary Piriven Year End Term Test - 2016

03 වසර / Grade 03

**පාලි** කාලය : පැය තුන යි

**PALI** Time : Three Hours

**I කොටසේ සියලු ම** ප්‍රශ්නවලට ද, **II කොටසින් 02, 03** ප්‍රශ්න හා තවත් ප්‍රශ්න 02ක් තෝරාගෙන ප්‍රශ්න **පහකට (05) පමණක්** පිළිතුරු සපයන්න.

**I කොටස**

01. කෙටි පිළිතුරු සපයන්න.

   i. ''පුබ්බමධොයිතමස්සරං සරෙන වියොජයෙ'' මෙහි අදහස ලියා දක්වන්න.

   ii. **ච** කාරයේ උත්පත්ති ස්ථානය ලියා දක්වන්න.

   iii. **තතියා** විභක්ති ප්‍රත්‍යය දෙක ලියා දක්වන්න.

   iv. ලෝපය යනු කුමක් ද? පරස්වරය ලොප්වන ආකාරය නිදසුනක් මගින් පෙන්වා දෙන්න.

   v. **තුල්‍යාධිකරණ** යනු කුමක් ද?

   vi. **සංඛ්‍යා තද්ධිත** ප්‍රත්‍යය 04ක් ලියන්න.

   vii. **භුත්ත, පචමාන, ධාවන්ත, භගවන්ත** යන පද අතර ඇති කෘදන්ත පදයක් නොවන පදය උපුටා දක්වන්න.

   viii. රසවාහිනි නම් ග්‍රන්ථයේ කථාවස්තු ප්‍රභේද දෙක ලියා දක්වන්න.

   ix. ධාතුමංජුසාව අයත්වන ව්‍යාකරණ සම්ප්‍රදාය කුමක් ද?

   x. ධම්මපදය අයත්වන්නේ ත්‍රිපිටකයේ කිනම් නිකායකට ද?

*(ලකුණු 4 × 10 = 40 යි)*

**II කොටස**

02. (අ) පහත සඳහන් ඡේදය සිංහලට නගන්න.

ථෙරො අත්තභාවං විජහිත්වා මහන්තං නාගරාජවණ්ණං අභිනිම්මිණිත්වා නන්දොපනන්දං චුද්දසක්ඛත්තුං භොගෙහි පරික්ඛිපිත්වා තස්ස ඵණමත්ථකෙ අත්තනො ඵණං ඨපෙත්වා සිනෙරුනා සද්ධිං අභිනිප්පීළෙසි. නාගරාජා පධූමායි. ථෙරො'පි න තුය්හංයෙව සරීරෙ ධූමො අත්ථි, මය්හම්පි අත්ථීති පධූමායි.

*(ලකුණු 05 යි)*

(ආ) පහත සඳහන් වාක්‍ය සිංහලට නගන්න.

   i. දෙවො වස්සතු කාලෙන.
   ii. අප්පමත්තා න මීයන්ති.
   iii. මිගා ගුහං පවිසන්ති.
   iv. රාජා කුමාරෙන සද්ධිං ගච්ඡති.
   v. සො පබ්බතං අධිවසති.

*(ලකුණු 05 යි)*

(ඉ) පහත සඳහන් වාක්‍ය පාලියට නගන්න.

   i. මිනිස්සු සුවෙන් වසත්.
   ii. රජ ධාර්මික වේවා!
   iii. පැරණි කොළ වැටෙයි, අලුත් කොළ හටගනියි.
   iv. ගුරුවරයා කීවේ ය.
   v. මම මනාකොට ඉගෙන ගන්නෙමි.

*(ලකුණු 05 යි)*

**03.** (අ) පහත සඳහන් ඡේදය සිංහලට නගන්න.

චොරො සකලගාමං ආහිණ්ඩිත්වා අඤ්ඤත්ථ පටිසරණං අලභන්තො ථෙරමෙව පටිසරණං කරොමී'ති විහාරං ගන්ත්වා සාමී, දාසස්ස වො පටිසරණං හොහි. ඉමං මතමනුස්සං මොචෙත්වා මං සුඛී කරොහීති යාචි. ථෙරො තං දිස්වා කම්පමානහදයො සීසං මත මනුස්සං මොචෙත්වා දූරෙ පක්ඛිපිත්වා තං උණ්හොදකෙන නහාපෙත්වා නාළිකාය තෙලං ගහෙත්වා තස්ස සකල සරීරෙ අබ්භඤ්ජිත්වා තෙන පොඨීතට්ඨානං සම්බාහන්තො නිසීදි.

*(ලකුණු 10 යි)*

(ආ) තමන්ට අවැඩ කරන්නෙකුට වුව ද විපතක් පැමිණි විට පිළිසරණ විය යුතු බව දැක්වෙන කථා පුවතක් රසවාහිනිය ඇසුරෙන් ලියා දක්වන්න.

*(ලකුණු 05 යි)*

**04.** (අ) සන්ධි ප්‍රභේද **තුන** නම් කොට උදාහරණ තුනක් ලියන්න.

(ආ) සමාස ප්‍රභේද **හය** නම් කොට උදාහරණය බැගින් ලියන්න.

(ඉ) ණායන, මන්තු, ඉක, තම, ධා, ත්‍ර යන ප්‍රත්‍යය යොදා තද්ධිත පදය බැගින් ලියන්න.

*(ලකුණු 3 + 6 + 6 = 15 යි)*

**05.** (අ) සංඛ්‍යාවාචක '**එක**' ශබ්දය හෝ '**ති**' ශබ්දය හෝ ලිංගත්‍රයේ සම්පූර්ණයෙන් වරනගන්න.
**(වරනැගීම් වගුව අවශ්‍යයි)**

*(ලකුණු 09 යි)*

(ආ) √**කර** ධාතුව අජ්ජතනී ආඛ්‍යාතයේ පරස්සපදයේ වරනගන්න.
**(වරනැගීම් වගුව අවශ්‍යයි)**

*(ලකුණු 06 යි)*

**06.** (අ) පාලි ව්‍යාකරණයේ දැක්වෙන ප්‍රධාන විභක්ති 07 අනුපිළිවෙළින් ලියා එම විභක්ති යෙදෙන විභක්ති අර්ථය නම් කරන්න.

*(ලකුණු 07 යි)*

(ආ) එම විභක්තිවලින් පළමු හා තෙවන විභක්ති දෙක සඳහා විභක්ති ප්‍රයෝග 03 බැගින් නිදසුන් සහිතව ලියා දක්වන්න.

*(ලකුණු 08 යි)*

**07.** පහත සඳහන් ගාථා සම්පූර්ණ කොට, ඉන් එක් ගාථාවක අදහස ලියා දක්වන්න.

(අ) අචිරං වතයං කායො .....

(ආ) න පරෙසං විලොමානි ......

(ඉ) චරන්ති බාලා දුම්මෙධා ......

*(ලකුණු 03 x 03 + 06 = 15 යි)*

***